ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා අධ්‍යයන පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - 2023/2024

03 වන මට්ටම

LLU 3604 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය I

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය- II

කාලය පැය 01 යි.

---

දිනය : 2025 ජනවාරි මස 06 වේලාව: ප.ව 1.30 - ප.ව 2.30

---

එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. 'බලතල බෙදා දැක්වීමේ සිද්ධාන්තය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රජාතන්ත්‍රවාදයේ එක් කුළුණක් වශයෙන් ස්ථාපිත අතර, ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ ඇතුළත් රාජ්‍යයේ ප්‍රධාන ආයතන එකිනෙකට අන්‍යෝන්‍ය වශයෙන් ස්වාධීනව ක්‍රියා කල යුතු බවත්, ඒවායේ කාර්යයන් සහ බලතල කිසිදු තනි පුද්ගලයෙක් විෂයෙහි සංකේන්ද්‍රගත නොවිය යුතු බවටත් එමගින් ප්‍රකාශ කෙරේ.'

   J. Alder, Constitutional & Administrative Law ( 10th Ed,Palgrave Law Master 2015) 136.

   මහා බ්‍රිතාන්‍යය සහ ශ්‍රී ලංකාව යන රාජ්‍යයන් හි සුදුසු උදාහරණ අනුසාරයෙන් ඉහත ප්‍රකාශය විශ්ලේෂණය කරන්න.

   ( ලකුණු 20 යි )

2. නීතියේ බලය යන සංකල්පය ඕනෑම ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක මූලික සාධකය වන අතර අසමානතාවය සහ අගතිය ට අදාළ ගැටළු ආමන්ත්‍රණය කිරීම හරහා සමාජයක් වෙනස් කිරීමට සහ පරිණාමය වීමට අවශ්‍ය විධිමත් ක්‍රමවේදයක් ද එමගින් සපයනු ඇත.

   මෙම සංකල්පය සම්බන්ධයෙන් වන අද්‍යතන අර්ථ නිරූපණයන් සහ තේරුම් ගැනීම් ඩයිසිගේ මත දැක්වීමේ සිට සැලකිය යුතු ප්‍රමාණයකින් ඉදිරියට පැමිණ තිබේ.

   ඔබ එකඟ වන්නෙහිද ? නීතියේ බලය යන සංකල්පය පිළිබද මෑත කාලීන අර්ථවිග්‍රහයන් ආශ්‍රිත සුදුසු උදාහරණ සහිතව මෙම ප්‍රකාශය විවේචනාත්මක විශ්ලේෂණයකට ලක් කරන්න.

   ( ලකුණු 20 යි )

*** හිමිකම් ඇවිරිණි ***